1696

නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - වාහල්කඩ
வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் – பதவிய
**Resident Project Management Office - Wahalkada**

වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
**Irrigation Management Division**
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
**Ministry of Irrigation & Water Resources Management**

වාහල්කඩ
பதவிய
padaviya

16 JUN 2020

මගේ අංකය / எனது இல. / My Ref No — 035/01/3
ඔබේ අංකය / உமது இல / Your Ref No —
දිනය / திகதி / Date — 2020/04/21

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අනුරාධපුර.

<u>වාහල්කඩ මහා වාරිමාර්ග ව්‍යාපාරයේ කන්න රැස්වීම් වාර්තාව (සංශෝධිත)</u>

පැවැත්වූ දිනය :- 2020.04.09
පැවැත්වූ වේලාව :- පෙ:ව: 10.00
පැවැත්වූ ස්ථානය :- ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | පී.සී වැලිවිට | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - පදවිය |
| 02 | එම්.පී.සී කුමාරනායක | සංවර්ධන නිලධාරි - ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 03 | ඩී.කේ.එස් ගයාශාන් | ඉංජි.සහකාර - වා:දෙ |
| 04 | එම්.ඒ ගාමිණි විජය | ජනපද නිලධාරි |
| 05 | ආර්.එම්.පී.එස්.කේ රත්නායක | තාක්ෂණ සහකාර - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 06 | ඩබ්.එම් ධනුෂක උදයංග | තාක්ෂණ සහයක- වා:දෙ |
| 07 | පී.ජයරත්න | සභාපති - කාශ්‍යප ගොවි සං: |
| 08 | පී.වීරසිංහ | සභාපති - මුගලන් ගොවි සං: |
| 09 | කේ.වික්‍රමසිංහ | භාණ්ඩාගාරික - කාශ්‍යප ගොවි සං: |
| 10 | කේ.විමලසේන | ලේකම්- කාශ්‍යප ගොවි සං: |
| 11 | කේ ආරියදාස | සභාපති - ගජබා ගොවි සං: |
| 12 | කේ.නිමල් කීර්තිරත්න | භාණ්ඩාගාරික - ගජබා ගොවි සං: |
| 13 | ඒ.දිසානායක | භාණ්ඩාගාරික - මුගලන් ගොවි සං: |
| 14 | එස් රූපසිංහ | සභාපති - පැරකුම් ගොවි සං: |
| 15 | පී.සක්කුමාර | සභාපති - ගැමුණු ගොවි සං: |
| 16 | කේ.ඒ විමලසූරිය | සභාපති - මහසෙන් ගොවි සං: |
| 17 | යූ.බී සේනාරත්න | ලේකම් - මහසෙන් ගොවි සං: |
| 18 | පී.බී.ඒ.අයි වික්‍රමසිංහ | භාණ්ඩාගාරික - මහසෙන් ගොවි සං: |
| 19 | නෙල්සන් චන්ද්‍රතිලක | ලේකම් - ගජබා ගොවි සං: |

<u>පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම :- සංවර්ධන නිලධාරි - ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය</u>

පැමිණ සිටි ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ඇතුළු සියළුම රාජ්‍ය නිලධාරීන් හා සියලුම ගොවි

සංවිධානවල නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව පවතින වියලි කාලගුණය යටතේ වැවේ ජලය අවම වීම නිසා කන්න රැස්වීම් තීරණ සංශෝධනය කිරීම අරමුණ ලෙස පැහැදිලි කිරන ලදී.

<u>ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - පදවිය :-</u>

මෙදිනට වැවේ ජල තත්වය උස අඩි 13.16 හා ධාරිතාවය අක්කර අඩි 12265 බව ප්‍රකාශ කරන ලදී. පසුගිය කන්න වල අද්දැකීම් අනුව යලේ වී අක්කරයක් පැසීම සඳහා අක්කර අඩි 6.5 පමණ වැයවී ඇති බැවින් ඉතා හොඳ ජල කළමනාකරණයකින් ජලය පරිහරණය කළහොත් මෙම තත්වය අක්කර අඩි 5.5 දක්වා අඩුකළ හැකි බව ප්‍රකාශ කරන ලදී. මේ වන විට වැවේ පවතින ජලය අනුව වගා කළහැකි වන්නේ අක්කර 1502 ක් බවත් රටේ පවතින තත්වය අනුව අතිරේක ආහාර භෝග හිගයක් පවතින බැවින් ඒ සඳහා ගොවීන් යොමු විය යුතු බවයි. එබැවින් අක්කර 1500 ක් වී වගා කර ඉතිරි ප්‍රමාණය අතිරේක ආහාර භෝග වගාකිරීම සුදුසු බව පුකාශ කරන ලදී.

<u>තාක්ෂණ සහකාර - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව :-</u>

පවතින අවම ජල ප්‍රමාණයට විකල්ප ලෙස කෙටිකාලීන වී එනම් මාස 2.5 හා 3 ප්‍රභේද සුදුසු බවයි.එමෙන්ම අතිරේක ආහාර බෝග සඳහා රජයේ 50% දායකත්වය යටතේ බීජ ලබාගත හැකි බවත් දන්වාසිටින ලදී.

ගොවි සංවිධාන වල නිලධාරීන් ද දීර්ග ලෙස අදහස් ඉදිරිපත් කළ අතර පෙර කන්න තීරණ පහත පරිදි සංශෝධනය විය.

| අ/අං | කාරණය | පෙර කන්න රැස්වීම් තීරණ |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත භෝගය | වී මාස 2½ ,3 හා අතිරේක භෝග |
| 02 | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය | වී අක්කර 1600<br>අතිරේක භෝග අක්කර 500 |
| 03 | වගා කිරීමට යෝජිත ප්‍රදේශය | මුළු ව්‍යාපාරයම |
| 04 | ගොවීන් විසින් ඇළවෙලි නඩත්තු කළයුතු අවසන් දිනය | 2020/04/15 |
| 05 | ගොවීන් විසින් නඩත්තු නොකරන ලද ඇළවෙලි ගොවි සංවිධානය විසින් නඩත්තු කළයුතු අවසන් දිනය | 2020/04/18 |
| 06 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන ඇළ හා දියබස්නා ඇළවල් නඩත්තු කළයුතු අවසන් දිනය | 2020/04/18 |
| 07 | මුල්වරට ජලය නිකුත්කළ යුතු දිනය | 2020/04/23 |
| 08 | වී වපුරා හෝ පැළ සිටුවා අවසන් කළ යුතු දිනය | 2020/05/15 |
| 09 | මුර ජලය ආරම්භ කළයුතු දිනය | 2020/05/13 |
| 10 | අවසන් වරට ජලය නිකුත්කිරීමට යෝජිත දිනය | 2020/07/25 |
| 11 | වගාව රක්ෂණය කළයුතු අවසන් දිනය | 2020/05/10 |
| 12 | වගා හානි දැනුම් දියයුතු අවසන් දිනය | 2020/08/25 |
| 13 | ට්‍රැක්ටර් යායෙන් ඉවත් කළයුතු දිනය | 2020/05/10 |
| 14 | අස්වනු නෙලා අවසන් කළයුතු දිනය | 2020/08/25 |
| 15 | ඇළවෙලි සුද්ද නොකිරීමේ දඩය බඹයකට | රු:200/= |
| 16 | සංවර්ධන මුදල් අයකිරීම අක්කරයකට | රු:200/= |
| 17 | නිර්මිත හානි දඩය | වාරිමාර්ග දෙ: තක්සේරුව අනුව |

එමෙන්ම සියලුම ගොවි මහතුන් තම කුඹුරෙන් අක්කර 1.5 ක් වී ද අක්කර 0.5 ක් අතිරේක භෝග ද වගාකළ යුතුය. එමෙන්ම මෙම කන්න රැස්වීම් තීරණ උල්ලංගනය කරන ගොවීන් හට නීතිමය පියවර ගැනිමට ද තීරණය කරන ලදී.

යෝජනා කළේ :- පී.වීරසිංහ - සභාපති, මුගලන් ගොවි සං:

ස්ථිර කළේ :- පී.ජයරත්න - සභාපති , කාශ්‍යප ගොවි සං:

ටී.ඩී.එන්.ප්‍රේමචන්ද්‍ර
නේවාසික ව්‍යාපාර කළමනාකරු
වාරිමාර්ග කළමනාක. … අංශය
වාහල්කඩ මහ වාරිමා. … ව්‍යාපාරය
වාහල්කඩ

ඇත්:කළේ

.................................

එම්.පී.සී කුමාරනායක

සංවර්ධන නිලධාරි

ටී.ඩී.එන්.ප්‍රේමචන්ද්‍ර

නේවාසික ව්‍යාපාර කළමනාකරු,

වාහල්කඩ ව්‍යාපාරය .

පිටපත්:-

01. අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය, කොළඹ - කා:දැ:ස:
02. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ,/අනුරාධපුර - කා:දැ:ස:
03. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, /අනුරාධපුර - කා:දැ:ස:
04. ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්, /අනුරාධපුර - කා:දැ:ස:
05. ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු - පදවිය - කා:දැ:ස: හා අවශ්‍ය කා:ස
06. තාක්ෂණ සහකාර - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා:දැ:ස: හා අවශ්‍ය කා:ස
07. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි කපුගොල්ලෑව /කැබිතිගොල්ලෑව - කා:දැ:ස: හා අවශ්‍ය කා:ස
08. සියලුම ගොවි සංවිධාන නිලධාරීන් - කා:දැ:ස: හා අවශ්‍ය කා:ස


නේවාසික ව්‍යා.කළමනාකරු RPM

ෆැක්ස් Fax 025 – 2253150

ඊ මේල් E-mail padaviyaimd@gmail.com